# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 476 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 18/03/2024 පැය 0620

# මාධ්‍ය නිවේදනය

**01. හෙරොයින් කිලෝග්‍රෑම් 01කට අධික ප්‍රමාණයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වලාන දූෂණ මර්ධන ප්‍රහාරක ඒකකය.**

2024.03.17 වන දින උදෑසන කාලයේදී හංවැල්ල පොලිස් වසමේ බාලගේවත්ත ප්‍රදේශයේදී වලාන දූෂණ මර්ධන ප්‍රහාරක ඒකකයේ නිළධාරීන්ට ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර හෙරොයින් කිලෝග්‍රෑම් 01 මිලි ග්‍රෑම් 03ක් හා මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම සඳහා යොදා ගත් බවට සැකකරන ජංගම දුරකතන 03ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන හංවැල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42ක් වන බ්‍රැන්ඩිගම්පල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු සන්තකයේ තිබී විවිධ බැංකුවලට අයත් බැංකු ගිණුම් පාස්පොත් 05ක් හා ඩෙබිඩ් කාඩ්පත් 04ක්ද පොලිසිය භාරයට ගෙන ඇත. සැකකරු බන්ධනාගාර ගතව සිටින මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු විසින් මෙහෙයවනු ලබන ජාවාරම්කරුවෙකුගේ සමීපතමයෙකු බවට විමර්ශනයේදී තොරතුරු අනාවරණය වී ඇත.

සැකකරු සම්බන්ධයෙන් තවදුරටත් හංවැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මෙරට නිශ්පාදිත ගිනි අවියක් සහ ගංජා සමග සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පානම පොලිස් ස්ථානය.**

2024.03.17 වන දින උදෑසන කාලයේදී පානම පොලිස් වසමේ අඹලන්ද රක්ෂිත ප්‍රදේශයේදී පානම පොලිස් ස්ථානයේ නිළධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **මෙරට නිශ්පාදිත ගිනි අවියක් හා ගංජා කිලෝග්‍රෑම් 344 ග්‍රෑම් 857 ක්**

සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් සැකකරුවන් දෙදෙනෙකු අත් අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 39 හා 47 යන වයස් වල පසුවන ඇඹිලිපිටිය හා සෙවනගල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙම සැකකරුවන් අඹලන්ද රක්ෂිතයේ තාවකාලිකව සකස් කරන ලද වාඩියක රැදී සිටිමින් ගංජා ගබඩා කරමින් හා ඇසුරුම් කරමින් සිටියදී මෙලෙස අත්අඩංගුවට පත්ව ඇත. පානම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**